ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2184/46 - 2020 ජූලි මස 17 වැනි සිකුරාදා - 2020.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: MTR/LND/L1/ACQUI/3998.
ඉ. අ. යොමු අංකය: 4-3/9/2017ඩබ්ලිව්එස්/459.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 427, නාවිමන දකුණ ග්‍රාම නිලධාරි වසමේ හුංගන්ගොඩ ගමේ පිහිටි මු. පි. මාර/2835 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන මතු සඳහන් ඉඩම මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ නිල්වලා ගඟ හරහා ලවන බාධකයක් ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කරගනු ලැබේ.

උපලේඛනය

1. **කැබලි අංක 01**

ඉඩමේ නම : පරමසේඤ්ඤකැටිය; ඉඩමේ විස්තරය : විවෘත මුඩුබිම ; ඉඩමේ හිමිකම කියන්නා: මුල් හිමිකම් පාන්නා නොදනී; ප්‍රමාණය: හෙක්. 0.113

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 අගෝස්තු මස 12 වන දින පෙ. ව. 10.30ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය. තවද 2020 අගෝස්තු මස 05 වන දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු යි.

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2020 ජූලි 14 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-862

---

ඇමුණුම් අංකය 01

ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 11/3/3/1/19/75.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු
අංකය: LD/05/2008/MV/299.

අංක 1769/21 හා 2012.08.03 දිනැති *ගැසට් පත්‍රයේ* කැබලි අංක 3778 සහ 3779 යටතේ හිමිකම් කියන්නා ජයභූමි දීමනා



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පත්‍ර අංක මධ්‍යම/ලග්/400 යටතේ හත්තොට අමුණ, තෝරපිටිය, අංක 139/10 පදිංචි ඩී. එම්. අනුර දිසානායක ලෙස සඳහන් වුවද, එය ''මධ්‍යම/ලග්/406 යටතේ හත්තොට අමුණ, තෝරපිටිය, අංක 139/10 පදිංචි ඩී. එම්. අනුර දිසානායක ලෙස'' සංශෝධනය විය යුතුය.

කැබලි අංකය 3778 හෙක්ටයාර් 0.0096
කැබලි අංකය 3779 හෙක්ටයාර් 0.0205

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2020 ජූලි මස 02 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ලග්ගල.

07-863

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

මගේ අංකය: 3/2/3/10/256.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 1988/9 හා 2016.10.10 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 2A පිටුවේ සඳහන් මු. පි. ගම් 4010හි කැබලි අංක 08 ලෙස සටහන් වන ඉඩම් කොටස මැණුම් සංශෝධන පරිදි කැබලි අංක 15 සහ 16 සහ 17 ලෙස විභජනය වී ඇති අතර කැබලි අංක 08ට අදාල ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරමි.

1. **කැබලි අංක 15**
ඉඩමේ නම : කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය : ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0680

2. **කැබලි අංක 16**
ඉඩමේ නම : කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය : ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත ; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: අංක 115/4, ටෙම්පර්ල්ස් පාර, ගල්කිස්ස හි පදිංචි විජේසූරිය ගුණවර්ධන මහවඩුගේ තිලකා හේමසීලි පෙරේරා; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0238.

3. **කැබලි අංක 17**
ඉඩමේ නම : කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය : ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත ; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා: අංක 257/2, ගලහිටියාව, ගනේමුල්ලෙහි පදිංචි මල්ලවආරච්චිගේ දෝන සුනේත්‍රා මල්ලවආරච්චි; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0189.

එස්. පී. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2019 ඔක්තෝබර් මස 10 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-864

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.